# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2413/37 - 2024 දෙසැම්බර් මස 04 වැනි බදාදා - 2024.12.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. වරින් වර සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කල අංක 24/2067/817/001 දරන ඒකාබද්ධ සංදේශය පිළිබඳව වූ 2024 නොවැම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව 2024 දෙසැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

1A - PG 6937 — 374 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල කෙසේ සඳහන් වුවද, එම රෙගුලාසිවල I සහ V උපලේඛනවල ලැයිස්තුගත කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව, 2024 දෙසැම්බර් 02 වැනි දින හෝ ඊට පසුව ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපළ වෙත පැමිණි, වෙනත් ලේඛන සමග රේගු සටහන්කරය (රේගු ප්‍රකාශය) 2024 දෙසැම්බර් 04 සිට 2024 දෙසැම්බර් 20 දක්වා කාලය තුළ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදෙන සහල් තොග සඳහා මෙයින් ඉවත් කරනු ලැබේ.

5. මෙම රෙගුලාසි උල්ලංඝනය කරමින් ආනයනය කරන ඕනෑම භාණ්ඩයක්, සියලුම ආශ්‍රිත පිරිවැය ආනයනකරු විසින් දරනු ලැබ ප්‍රතිඅපනයනය කළ යුතුය.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්'' නිකුත් කරනු ලැබිය යුතුය.

7. මෙම රෙගුලාසීන්ට අදාළව පැන නගින කිසියම් ගැටළුවක් සම්බන්ධයෙන්, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විමසා අවසන් තීරණය ලබාදිය යුතුය.

8. මෙම රෙගුලාසි 2024 දෙසැම්බර් 04 දින සිට බලාත්මක වේ.

EOG 12 - 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.